# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2258/54 – 2021 දෙසැම්බර් මස 17 වැනි සිකුරාදා – 2021.12.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/02/2018/57.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව–

*එක් පාර්ශවයක් වශයෙන්,*

1. ලෙකෝ නව විදුලි කාර්මික ශිල්පීන්ගේ සංගමය, අංක 59, මිරිහාන පාර, නුගේගොඩ.
2. වාණිජ කර්මාන්ත හා සේවා ප්‍රගතිශීලී සේවක සංගමය, අංක 59, මිරිහාන පාර, නුගේගොඩ.

සහ

*අනෙක් පාර්ශවය වශයෙන්,*

ලංකා ඉලෙක්ට්‍රිසිටි කම්පැණි (ප්‍රයිවට්) ලිමිටඩ්, ඊ. එච්. කුරේ ගොඩනැගිල්ල, 411, ගාලු පාර, කොළඹ 03.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, මාතලේ, හිග්ගෝල්ල පාර, පළමු පටුමග, අංක 34/64, ඒ. බී. හේරත් මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

නිමල් සිරිපාල ද සිල්වා,
කම්කරු අමාත්‍ය.

2021 නොවැම්බර් මස 30 වැනි දින,
කොළඹ දී ය.

1A – G 35596 – 20 (2021/12)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

මගේ අංකය: IR/COM/02/2018/57.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශවයක් වශයෙන්,*

1. ලෙකෝ නව විදුලි කාර්මික ශිල්පීන්ගේ සංගමය, අංක 59, මිරිහාන පාර, නුගේගොඩ.
2. වාණිජ කර්මාන්ත හා සේවා ප්‍රගතිශීලී සේවක සංගමය, අංක 59, මිරිහාන පාර, නුගේගොඩ.

සහ

*අනෙක් පාර්ශවය වශයෙන්,*

ලංකා ඉලෙක්ට්‍රිසිටි කම්පැණි (ප්‍රයිවට්) ලිමිටඩ්, ඊ. එච්. කුරේ ගොඩනැගිල්ල, 411, ගාලු පාර, කොළඹ 03.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණු වනුයේ,**

''ලංකා ඉලෙක්ට්‍රිසිටි කම්පැණි (ප්‍රයිවට්) ලිමිටඩ් හි විදුලි කාර්මික ශිල්පීන්හට පහත කරුණු සම්බන්ධයෙන් එනම්,

1. 1998 ටීම් වාර්තාව අනුව විදුලි කාර්මික ශිල්පීන් අදාළ වැටුප්තලවල නොපිහිටුවීම.
2. විදුලි කාර්මික III, II හා I ශ්‍රේණීන් පිළිවෙළින් E3, E6 හා E7 වැටුප් තලවලට සංශෝධනය නොකිරීම හා
3. 2016.01.01 දින සිට ක්‍රියාත්මක කළ නව උසස්වීම් පටිපාටියට අනුව සේවා කාලය ගණනය කර නියමිත වැටුප් පියවර ලබා නොදීම.

   මගින් අසාධාරණයක් සිදුව තිබේ ද යන්න හා එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් හිමිවිය යුතු සහනයන් මොනවාද? යන්න පිළිබඳව වේ.''

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2021 නොවැම්බර් මස 29 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල්තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 12 – 190

---

මගේ අංකය: IR/COM/04/2019/220.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව–

ජී. එස්. ආර්. ප්‍රනාන්දු මයා., 388/3/බී, දූවේ වත්ත, අන්නාසිවතුගොඩ පාර, අන්නාසිවතුගොඩ.

සහ

ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව, රොක්හවුස් පටුමඟ, කොළඹ 15.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත

පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, මීනුවන්ගොඩ, ධර්මරාජ මාවත, අංක 11/ඒ, නීතිඥ එල්. ඒ. ප්‍රියන්ති ලියනආරච්චි මහත්මිය පත්කර ඇය වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**නිමල් සිරිපාල ද සිල්වා,**
කම්කරු අමාත්‍ය.

2021 නොවැම්බර් මස 30 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/04/2019/220.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

ජී. එස්. ආර්. ප්‍රනාන්දු මයා., 388/3/බී, දූවේ වත්ත, අන්නාසිවතුගොඩ පාර, අන්නාසිවතුගොඩ.

සහ

ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව, රොක්හවුස් පටුමඟ, කොළඹ 15.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණු වනුයේ,

''ජී. එස්. ආර්. ප්‍රනාන්දු මහතාට ජ්‍යෙෂ්ඨ ආරක්ෂක පරීක්ෂක තනතුර නොලැබීමෙන් අසාධාරණයක් සිදු වී තිබේ ද? එසේ නම් ඔහුට හිමිවිය යුතු සහනයන් කවරේ ද? යන්න පිළිබඳව වේ.''

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2021 නොවැම්බර් මස 29 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල්තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 12 – 0191

---

මගේ අංකය: IR/15/10/2010.

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණයේ) ව්‍යවස්ථාපිත අණපනත්වල (131 වන පරිච්ඡේදය වන) කාර්මික ආරාවුල් පනත**

4(1) වැනි වගන්තිය යටතේ දුන් නියෝගය අවලංගු කිරීම

1957 අංක 14 සහ 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ විධිවිධාන) පනත සමග කියවෙන) පනත්වලින් සංශෝධිත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තිය යටතේ 2020.12.28 වන දින අංක 2208/7 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2020.12.10 වැනි දින දරන නියෝගයෙන්,

ලංකා ආරක්ෂක සේවා සංගමය, අංක 103, පී. එස්. පෙරේරා මාවත, මාම්පේ, පිලියන්දල.

සහ

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, අංක 500, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

අතර පවත්නා 2020.11.20 දින දරන කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ සඳහන් කරන ලද කාරණය පිළිබඳව වූ කාර්මික ආරාවුල් බේරුම් කිරීමෙන් සමථයට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් නීතිඥ ජයසේකර මුදියන්සේලාගේ කපිල ජයසේකර මහතා වෙත යොමු කරන ලදී.

යථෝක්ත නියෝගය, අවලංගු කළයුතු යැයි දැන් පෙනී යන හෙයින්, කම්කරු අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා වන මා, එම නියෝගය අවලංගු කරන අතර, එකී 2020.12.10 දින දරන නියෝගය මත ක්‍රියා නොකරන ලෙස ද මෙයින් නියෝග කරමි.

**නිමල් සිරිපාල ද සිල්වා,**
කම්කරු අමාත්‍ය.

2021 නොවැම්බර් මස 30 වැනි දින,
කොළඹ දී ය.

EOG 12 – 0192/1

---

මගේ අංකය: IR/15/10/2010.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියමකර දක්වා ඇති කරුණු පිළිබඳව –

ලංකා ආරක්ෂක සේවා සංගමය, අංක 103, පී. එස්. පෙරේරා මාවත, මාම්පේ, පිලියන්දල.

සහ

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, අංක 500, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, මාතලේ, කච්චේරි පාර, 24/9, ආචාර්ය කේ. ඒ. එස්. කීරගල මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**නිමල් සිරිපාල ද සිල්වා,**
කම්කරු අමාත්‍ය.

2021 නොවැම්බර් මස 30 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/15/10/2010.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

ලංකා ආරක්ෂක සේවා සංගමය, අංක 103, පී. එස්. පෙරේරා මාවත, මාම්පේ, පිලියන්දල.

සහ

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, අංක 500, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණු වනුයේ,

I. ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් ආරක්ෂක අංශ සඳහා නිලධාරීන් බඳවා ගැනීමේදී/පුරප්පාඩු පිරවීමේදී පිටතින් සේවකයින් බඳවා ගැනීම තුළ සුදුසුකම් ලත් ආයතනයේ සේවකයින්ට අවස්ථාවක් නොලැබීමෙන් අසාධාරණයක් සිදුවී ඇත් ද යන්න හා එසේ වී නම් ඔවුනට කුමන සහන හිමිවිය යුතු ද? යන්න,

II. ආරක්ෂක නියාමක 1 ශ්‍රේණියේ නිලධාරීන් විශාල පිරිසක් සඳහා උසස්වීම් නොලැබීම හා සුදුසුකම් සපුරා ඇතත් උසස්වීම් නොලබා ඔවුන් සිටි ශ්‍රේණියේම විශ්‍රාම යාමට සිදුවීම නිසා අසාධාරණයක් සිදුවී ඇත් ද යන්න හා එසේ වී නම් ඔවුනට කුමන සහන හිමිවිය යුතු ද? යන්න

III. සමහර ආරක්ෂක නිලධාරීන්ට පිළිගත් උසස්වීම් පටිපාටිය උල්ලංඝනය කරමින් උසස්වීම් ලබා දීම හේතුවෙන් සුදුසුකම් සහිත සෙසු ආරක්ෂක නිලධාරීන්ට අසාධාරණයක් සිදුවී ඇත් ද යන්න හා එසේ වී නම් ඔවුනට කුමන සහන හිමිවිය යුතු ද? යන්න

IV. සුදුසුකම් ලබා ඇති ආරක්ෂක නිලධාරීන්ට විශ්‍රාම යෑමට පෙර ආරක්ෂක නියාමක 1 ශ්‍රේණියේ නිලධාරීන්ට හිමි උසස්වීම් ලබා නොදීම නිසා අසාධාරණයක් සිදුවී ඇත් ද යන්න හා එසේ වී නම් ඔවුනට කුමන සහන හිමිවිය යුතු ද? යන්න පිළිබඳව වේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2021 නොවැම්බර් මස 29 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල්තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 12 – 0192/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.